# තනතුරු ඇබෑර්තු
# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ස්වාමීන් වහන්සේලා සහ පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

<u>අධ්‍යයන තනතුරු</u>

**01. මහාචාර්ය (ප්‍රමුඛ) - (පුරප්පාඩු සංඛ්‍යාව -02)**

බෞද්ධ දර්ශනය / බෞද්ධ ශිෂ්ටාචාරය / ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය / පුරාවිද්‍යාව / අධ්‍යාපන විද්‍යාව / සමාජවිද්‍යාව / මනෝවිද්‍යාව / ඉතිහාසය / දර්ශනය / පුස්තකාල හා විඥාපන විද්‍යාව /උරුම කළමනාකරණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක - 916, 04/2014 සහ චක්‍රලේඛ ලිපි අංක - 04/2010

**02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / කථිකාචාර්ය (ආධුනික) -** ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය/ බෞද්ධ දර්ශනය/ බෞද්ධ ශිෂ්ඨාචාරය/පාලි **(පුරප්පාඩු සංඛ්‍යාව -01)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක - 721, 935, 07/2018 සහ 08/2016

<u>අනධ්‍යයන තනතුරු</u>

03. **රියදුරු III ශ්‍රේණිය (පුරප්පාඩු සංඛ්‍යාව - 02)**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2024 අනුව
<u>සුදුසුකම්</u>

- අයදුම්කරු අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් වාර දෙකකට නොවැඩි ගණනකදී සම්මාන සාමාර්ථ්‍යය දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී සිටිය යුතුය.
  **සහ**
- බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය ලබාගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු 03 ක රිය පැදවීමේ පළපුරුද්දක් තිබීම.

**වයස** - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි.

**සටහන් -**
(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

(ඇ) විශිෂ්ය හා සදාචාරාත්මක චරිතයක් විය යුතුයි.

**වැටුප් පරිමාණය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 සහ 02/2025(i)**

**මහාචාර්ය (ප්‍රමුඛ)** - රු. 198,280 -13×4,850- 261,330 p.m. [U-AC 5(II)] මූලික වැටුප් පියවර රු. 198,280.00 + අධ්‍යයන දීමනාව 124%+13,300+මූලක වැටුපන් 21% පර්යේෂණ දීමනාව සහ ජීවන වියදම් දීමනාව රු. 17,800.00

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I** – රු. 160,520-7x3,900-187,820/-p.m. [U-AC 3(I)] මූලික වැටුප් පියවර රු. 160,520.00 + අධ්‍යයන දීමනාව 116%+2,200+ මූලක වැටුපන් 21% පර්යේෂණ දීමනාව සහ ජීවන වියදම් දීමනාව රු. 17,800.00

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II** – රු. 138,980-11x2,940-171,320/-p.m. [U-AC 3(II)] මූලික වැටුප් පියවර රු. 138,980.00 + අධ්‍යයන දීමනාව 116%+2,100.00+ මූලක වැටුපන් 21% පර්යේෂණ දීමනාව සහ ජීවන වියදම් දීමනාව රු. 17,800.00

**කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)** – රු. 121,340-5x2,940-136,040/-p.m. [U-AC 3(III)] මූලික වැටුප් පියවර රු. 121,340.00 + අධ්‍යයන දීමනාව 102%+1,800.00+ මූලික වැටුපන් 21% පර්යේෂණ දීමනාව සහ ජීවන වියදම් දීමනාව රු. 17,800.00

**කථිකාචාර්ය (ආධුනික)** - රු. 94,400 -10×2,400-118,400/-p.m. [U-AC 3(IV) මූලික වැටුප් පියවර රු. 94,400.00 + අධ්‍යයන දීමනාව 91%+1,200.00+ මූලික වැටුපන් 21% පර්යේෂණ දීමනාව සහ ජීවන වියදම් දීමනාව රු. 17,800.00

**රියදුරු III ශ්‍රේණිය** - රු. 48,005-16x490 - 55,845/-p.m [U- PL 3(III)]

**සටහන්:**

- මහාචාර්ය (ප්‍රමුඛ),ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා අයදුම් කළ හැක්කේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පමණි.
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රථම උපාධිය හදාරන ලද අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)/ කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා පුස්කොළ පොත් සංස්කරණය ඇතුළු බෞද්ධ උරුමයන්ට අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වයක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා බඳවා ගත් පසු අවම වශයෙන් වසර 10 ක අනිවාර්ය සේවා කාලයක් මෙම විශ්වවිද්‍යාලයේ සේවය කිරීමට විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.
- ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීමේ හැකියාව අත්‍යාවශ්‍ය සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- ඉහත තනතුරුවලට අදාළ සුදුසුකම් පිළිබඳ විස්තර www.busl.ac.lk වෙතින් බා ගත හැක.

**ප්‍රතිලාභ:**

- ඉහත සඳහන් තනතුරු සඳහා වැටුප්වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අනෙකුත් දීමනා ද හිමිවේ.
- විශ්වවිද්‍යාල සේවයට බඳවා ගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සමාජිකත්වය ලැබේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15% ක මුදලක් බැර කරනු ලැබේ.) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය ප්‍රකාරව අධ්‍යයන තනතුරු සඳහා වැටුප් සහිත සහ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු හිමිවේ.
- මහාචාර්ය (ප්‍රමුඛ) සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II තනතුරු සඳහා සප්ත වාර්ෂික නිවාඩු හිමිකම ඇත.

**<u>අයදුම්පත්</u>**

i. අයදුම්පත් හා අනෙකුත් විස්තර 2026.02.03 දිනට ප්‍රථම මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි (ආයතන) වෙතට ඉල්ලුම් කරන තනතුර ඇතුළත් ලිපියක් සමග සෙ.මී. 23x10 ප්‍රමාණයේ ලිපිනය සහිත. මුද්දර ඇල වූ ලිපි කවරයක් එවීමෙන් ලබා ගත හැකි අතර අයදුම්පත් හා බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ඇතුළු විස්තර **www.busl.ac.lk** වෙබ් අඩවියෙන් ද බාගත හැකිය.

ii. එක් තනතුරකට අමතරව අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

**<u>අයදුම්කරන පිළිවෙල</u>**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජීව දත්ත තොරතුරු පත්‍රිකාව, සහතික කරන ලද සහතික පිටපත් සහ ඊට අදාළ ලේඛන සමග ලියාපදිංචි තැපෑලෙන් සහකාර ලේඛකාධිකාරි (ආයතන), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර යන ලිපිනයට 2026.02.17 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය. මහාචාර්ය (ප්‍රමුඛ) තනතුර සඳහා පමණක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2026.03.04 දින වේ.අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

ii. විශ්වවිද්‍යාල/රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

iii. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ආකෘතියෙන් ඉදිරිපත් කර නොමැති, ඉහත අවශ්‍යතාවන්ට පටහැනිව ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. අයදුම්කරුවන් කෙටි ලේඛන ගත කිරීම හා එම අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**ලේඛකාධිකාරි (වැඩ බලන)**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය**
**2026.01.18**